


20 වන පිටෙන්

අවහිර වී ඇති බව දැන ගතිමු. සවස් වන විට මළවුන්ගේ සිරුරු හෝ සිරුරු වලින් ඉතිරිවී තිබුණු කොටස් මිනි පෙට්ටි වල බහා ගෙනයන දර්ශනය දුටු කාගේත් ඇසට කඳුලක් ගලා එන්නට ඇත.

1974 දෙසැම්බර් මස 4 වන දින මෙම අවාසනාවන්ත ඉරණමට ගොදුරු වුයේ Martinair MP138 නම් ඉන්දුනීසියාවේ සිට කටුනායක හරහා සවුදි අරාබියාවේ ජෙඩා ගුවන් තොටුපලට යන මක්කම හජ්ජි වන්දනාවේ යෙදුනු බැතිමතුන් පිරිසකි. එම යානයේ මගීන් 182 දෙනෙකු සහ කාර්ය මණ්ඩලය නව දෙනෙකු ගමන්කර තිබේ. එහි සිටි 191 දෙනාම අනතුරින් මරණයට පත්වී ඇත.

Martinair MP138 අහස් යානය, ශ්‍රී ලංකාවේ දකුණු දිග යාල ප්‍රදේශයෙන් දිවයිනේ අහසට ඇතුල්වී තෙලුල්ල, හල්පේ, හල්දුම්මුල්ල, බගවන්තලාව සහ නෝර්වුඩ් යන ප්‍රදේශ උඩින් යාත්‍රාකර ගිනිගත්හේන පෙනෙන තෙක් මානයේදී සප්ත කන්‍යා කඳු වැටියේ හැපී ගිනිගෙන දැවී කඳු පාමුලට වැටී ඇත.

සිද්ධිය සම්බන්ධව පරීක්ෂණ පැවැත්වූ දේශීය සහ විදේශීය විශේෂඥ කණ්ඩායම් සිද්ධියට හේතු වශයෙන් විවෘත තීන්දුවක් දී තිබේ. ගුවන් යානයේ නියමුවන්ට ගුවන් මග නුහුරු බව, ගමන්මග හසුරුවන උපකරණවල දෝෂ සහිත බව, යානය බිමට බැස්සවීම සඳහා නියමිත පථය හඳුනා නොගැනීම වැනි හේතු රාශියක් තිබිය හැකි බව ඔවුන්ගේ නිගමනවල සඳහන් කර තිබෙන බව පෙනේ.

මෙම අවාසනාවන්ත සිද්ධධිය ඇසින් දුටු අපට කලක් ගතවන තුරුම එයින් ඇතිවූ කම්පණයෙන් අත් මිදීමට නොහැකිවිය.

(ඡායාරූප සහ තොරතුරු 2014 නොවැම්බර් 13 දින සන්ඩේ ටයිම්ස් පුවත් පතෙහි පළවූ The Doomed Flight නම් ලිපිය ඇසුරෙනි.)

# නිසි වදන්

## මේ සිංහල වදන් වල තේරුම් ඔබ දන්නවාද

**ජිගීෂාව** - ඉහළට නැගීමට ඇති කැමැත්ත

**පිලිස්තීනු** - හීන රසික බැවින් යුතු (අවරසික)

**නෛසර්ගික** - නිසර්ග+ඉක - ස්වභාවයෙන් ම, උපතින් ම

**කටාක්ෂ** = නෙත් කොනින් / ඇස් අගින්

**චිත්තා පරවශ ව** = කල්පනාවෙන්, කල්පනා කරමින්, 4 සිතිවිල්ලෙන්

**තඹර** - නෙලුම්

**අවගමනය** - පසුබැසීම

**සන්ථාගාරය** - රැස්වීම්ශාලාව / විශ්‍රාමශාලාව

**ප්‍රෝත්සාහී** - දැඩි උනන්දුවක් දක්වන

**සපත්නීරෝෂය** - බිරිඳකගේ සිතෙහි සැමියාගේ වෙනත් බිරිඳක් කෙරෙහි ඇතිවන කෝපය

**වරංගනා** උතුම් කාන්තාව

